කොළඹ විශ්ව විද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

තෙවන වසර දෙවන වාර අවසන් පරීක්ෂණය (ආර්ථික විද්‍යාව) 2016/17

# ECN 3265: මූල්‍ය වෙළඳපොළ

කාලය පැය (02) දෙකයි

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක 01.**

i. කිසියම් ආර්ථිකයකට ඉහළ ආර්ථික ප්‍රගතියක් අත්කර ගැනීමට සීමිත අරමුදල් කාර්යක්ෂම අයුරින් බෙදා හැරීම සඳහා මූල්‍ය වෙළඳපොලේ කාර්යභාර්ය පැහැදිලි කරන්න. [ලකුණු 13]

ii. ණය (debt) සහ කොටස් (equity) වෙළඳපල අතර වෙනස්කම පැහැදිලි කරන්න. [ලකුණු 12]

**ප්‍රශ්න අංක 02**

i. ඔබ පොළී අනුපාතය නිර්වචනය කරන්නේ කෙසේද? [ලකුණු 08]

ii. කිසියම් ආයෝජනයක් ඵලදායි ආයෝජන අවස්ථාවක් වෙනුවෙන් අවුරුදු දෙකක කාලයක් සඳහා රුපියල් 200,000 ක් ණයට ගත්තේ යැයි උපකල්පනය කරන්න. ඒ සඳහා අදාල වන වාර්ෂික පොළී අනුපාතය 12% වේ නම් අවුරුදු දෙක අවසානයේ ආයෝජකයාට ගෙවීමට සිදුවන මුළු මුදල් ප්‍රමාණය ගණනය කරන්න. [ලකුණු 08]

iii. සුදුසු රූප සටහන් හා උදාහරණ භාවිතා කරමින් පොළී අනුපාතය හා ආයෝජනය අතර පවතින සම්බන්ධතාවය විග්‍රහ කරන්න. [ලකුණු 09]

**ප්‍රශ්න අංක 03**

i. බැඳුම්කර සඳහා පවතින ඉල්ලුම තීරණය කරන සාධක සුදුසු රූප සටහනක් භාවිතයෙන් විස්තර කරන්න. [ලකුණු 12]

ii. සුදුසු උදාහරණයක් භාවිතා කරමින් බැඳුම්කර මිල හා බැඳුම්කර පොළී අනුපාතය අතර අනුලෝම සම්බන්ධතාවය විස්තර කරන්න. [ලකුණු 13]

**ප්‍රශ්න අංක 04**

i. ඉඩමක් මිලදී ගැනීම සඳහා කිසියම් පුද්ගලයෙකුට මූල්‍ය ආයතනයක් මගින් 15% පොළී අනුපාතයක් යටතේ රුපියල් 500000 ක ණය මුදලක් ලබා දෙන ලදි. මෙම අවස්ථාවේ අපේක්ෂිත උද්ධමන අනුපාතය 8% විය. නමුත් වර්ෂ අවසානයේ සැබෑ උද්ධමන අනුපාතය 11% ක් විය. ඉහත මූල්‍ය ගනුදෙනුවේ ප්‍රතිඵල දෙපාර්ශවයටම බලපාන ආකාරය ඔබ විග්‍රහ කරන්නේ කෙසේද? [ලකුණු 10]

ii. (අ) මුහුණත් අගය රුපියල් 1000 වන එක් අවුරුදු බැඳුම්කරයක (වට්ටම්) විකුණුම් මිල රුපියල් 950 වේ. බැඳුම්කරයේ ප්‍රතිලාභ අනුපාතය ගණනය කරන්න. [ලකුණු 07]

(ආ) ප්‍රතිලාභ අනුපාතිකය 12% වන වසර දෙකක කාලයක් සඳහා නිකුත් කරන ලද රුපියල් 1000 ක වටිනාකමින් යුත් බැඳුම්කරයක ආයෝජනය කිරීමෙන් ආයෝජකයාට උපයාගත හැකි සමස්ත ප්‍රතිලාභය ගණනය කරන්න. [ලකුණු 08]

**ප්‍රශ්න අංක 05**

ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි පහත දැක්වෙන මූල්‍ය උපකරණයන්ගේ කාර්යභාර්ය සැලකිල්ලට ගනිමින් ඒවායේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න.

i. භාණ්ඩාගාර බිල්පත් [ලකුණු 06]

ii. භාණ්ඩාගාර බැඳුම්කර [ලකුණු 06]

iii. රුපියල් ණය [ලකුණු 06]

iv. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර [ලකුණු 07]

**ප්‍රශ්න අංක 06**

v. 2008 මූල්‍ය අර්බුදය තිව්‍ර කිරීම සඳහා බලපෑ ප්‍රධාන සාධක කවරේද? [ලකුණු 13]

vi. ශ්‍රී ලංකා ආර්ථිකය මත 2008 මූල්‍ය අර්බුදයෙහි බලපෑම් ඔබ විස්තර කරන්නේ කෙසේද? [ලකුණු 12]

**ප්‍රශ්න අංක 07**

පහත සඳහන් ඒවා අතරින් 4 ක් සම්බන්ධයෙන් කෙටි විස්තර සපයන්න

i. ආර්ථිකයට මූල්‍ය වෙළඳපළෙහි ඇති වැදගත්කම

ii. මූල්‍ය පද්ධතිය තුළ කොටස් වෙළඳපළෙහි කාර්යභාර්ය

iii. මුළු පොළී අනුපාතිකය

iv. භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ ද්විතික වෙළඳපල

v. කල්පිරීමේ ප්‍රතිලාභ [Yield to Maturity]

vi. අනාගත ඉපයීමක වර්තමාන වටිනාකම

vii. කල්පිරීමේ ප්‍රතිලාභ වක්‍රය [Yield Curve] [ලකුණු 6.5 බැගින්]

*************